**ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම- 2017**

**------------------------------------------------------**

ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මුදල් ප්‍රවාහයක් සම්බන්ධ වී නොතිබුණ ද, මව් සමාගමට නිකුත් කරන ලද රු.71,800 ක් වටිනා පරිගණක ආයෝජන ක්‍රියාවලියෙන් ලද මුදල් ප්‍රවාහයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ දී හඳුනාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් ආදායම් නොමැති වුවද, එකතුව රු.22,360 ක් වූ කුලී ගාස්තු සහ සුළු මුදල් වියදම් මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් පිරිවැය ලෙස හඳුනාගෙන තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.15,229,562 ක් වටිනා ණයගැතියන්ට අදාළව, කිසිදු අයකර ගැනීමේ ක්‍රියා මාර්ගයක් නොමැතිව අඩමාන ණය සඳහා සම්පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇති වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කුමපඅ සඳහා ශ්‍රීලංමුවප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවය පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙහි අවශ්‍ය පරිදි පහත සඳහන් කරුණු දක්වමි.

අ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

ආ. - තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම විස්තර කෙරෙන ඡේදයන්ට බලපෑ හැකි කරුණු හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

#### 2.1.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ ව්‍යාපාර අලාභ, සෘණාත්මක කාරක ප්‍රාග්ධනය සහ සෘණාත්මක ණය ගෙවීමේ ආන්තිකය හේතුවෙන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2018 පෙබරවාරි 15 දින එහි මෙහෙයුම් නවතා දැමීමට තීරණය කර තිබුණි. එම නිසා, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය භාවිතා කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,435,373ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.6,693,385 ක බදු පූර්ව ශුද්ධ අලාභයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.258,012 ක සුළු වර්ධනයක් දක්නට ලැබුණි. බෙදාහැරීමේ වියදම් අඩුවීම මෙම වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව වී තිබුණි.

## 3.2 අගය එකතුවීම

සමාගමේ අගය එකතුවීම විශ්ලේෂණයේදී, 2014 වර්ෂය සඳහා සමාගමේ අගය එකතුවීම රු.1,897,969 ක් වූ අතර ඉන්පසුව 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අගය එකතුවීම අඛණ්ඩව සෘණාත්මක වටිනාකම් පෙන්නුම්කර තිබුණි. ඒ අනුව, සේවක වැටුප්, රජයේ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව 2015 වර්ෂය සඳහා සමාගමේ අගය එකතුවීම රු.5,194,890 ක සෘණාත්මක අගයක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.1,028,434 ක සෘණාත්මක අගයක් විය.

## 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
කාරක ප්‍රාග්ධන කළමනාකරණය සහ ණය ගෙවීමේ ආන්තිකය

සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී, 2015 සිට කාරක ප්‍රාග්ධනය අඛණ්ඩ සෘණාත්මක අගයක් පෙන්නුම් කර තිබුණු අතර පසුගිය වර්ෂයේ රු.16,585,267 ක සෘණාත්මක අගය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය අවසාන වන විට එය රු.22,868,875 ක සෘණාත්මක අගයක් වී තිබුණි. එමනිසා, සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය ඉතා දුර්වල මට්ටමක වූ බව හෙළිදරව් විය. එසේම, 2016 වර්ෂයේ දී රු.19,433,502 ක් වූ සෘණාත්මක ණය ගෙවීමේ ආන්තිකය සමාලෝචිත වර්ෂය තුළ රු.25,868,875 ක් හෙවත් සියයට 33 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 මෙහෙයුම් දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් ඉපයීමකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් තිදෙනෙකුට සමාගම වැටුප් සහ වේතන වශයෙන්එකතුව රු.5,355,534 ක් ගෙවා තිබුණි. තවද, මෙම සේවකයින් වෙනුවෙන්, පුහුණු කිරීමේ වියදම් ලෙස රු.115,300 ක් ද වැයකර තිබුණි.

(ආ) සමාගම එහි ස්ථාපිත අරමුණු ඉටුකරගැනීම වෙනුවෙන් කිසිදු කාර්යයක් ක්‍රියාත්මක කර නොතිබුණු බැවින්, එහි වියදම් මූල්‍යායනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම මව් සමාගම මත රැඳී සිටීමට සමාගමට සිදු වී තිබුණි. එබැවින්, 2017 දෙසැම්බර් 31 දින වන විට, රු.22,704,067 ක මුදලක් මව් සමාගමට ගෙවීමට සිදු වී තිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**----------------------------------------**

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 ප්‍රකාරව සමාගම ආරම්භයේ සිටම සංයුක්ත සැලැස්මක්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සහ අයවැයක් පිළියෙල කර නොතිබුණි.